<u>මාධ්‍ය නිවේදනය</u>

## විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය (e-NIC) යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිගණක හා උපකරණ පද්ධති සඳහා විදුලිය බෙදාහැරීමේ ඒකක (Power Distribution Units) ප්‍රසම්පාදනය පිළිබඳ පලවන නොමග යවන සුළු මාධ්‍ය වාර්තා පිළිබඳ කරුණු පැහැදිලි කිරීම

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය (e-NIC) අවශ්‍යතා අනුව පුද්ගල ලියාපදිංචිය හා ජෛවමිතික දත්ත එකතු කිරීම වෙනුවෙන් මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලම පාහේ ආවරණය වන සේ කලකට පෙර බෙදා හැර ඇති පරිගණක හා අදාළ උපාංග සහිත ඒකක වෙත සුරක්ෂිතව හා තිරසාරව විදුලිය ලබා දීමෙන් පසුව කඩිනමින් භාවිතයට ගෙන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ජාතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම මෙම ප්‍රසම්පාදනයේ අරමුණ වූ අතර ඒ වෙනුවෙන් පිරිවැය සඵලදායී ක්‍රමවේද යොදා ගැනීමේ විවිධ විකල්ප ද සළකා බලන ලදි.

මෙම ප්‍රසම්පාදනයේ ලංසු ලේඛන සැකසීමේ දී මොරටුව විශ්ව විද්‍යාලය හා ICTA ආයතනය නියෝජනය කරන ලද විදුලි බල සම්පාදනය හා තොරතුරු තාක්ෂණ උපාංග ජාලකරණය පිළිබඳ විශේෂඥ දැනුම සහිත තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ මත අවශ්‍ය ප්‍රමිතීන්ගෙන් යුත් පිරිවිතර භාවිත කරන ලදි. එලෙස සකසන ලද ලංසු ලේඛන යොදාගෙන උපකරණ කට්ටල 700ක් ප්‍රසම්පාදනය කිරීම ආරම්භ කරන ලද්දේ දැනට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව විසිනි.

මෙම පිරිවිතර හා ක්‍රමවේදය සැකසීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 51ක් ආශ්‍රිතව මීට පෙර ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ආරම්භ කෙරුණු තොරතුරු තාක්ෂණ උපාංග ඒකක වෙත සාමාන්‍ය තත්ත්වයේ උපාංග භාවිතයෙන් විදුලිය සම්බන්ධ කිරීමේ දී ලැබූ අත්දැකීම්, විශේෂයෙන්ම තාක්ෂණික දෝෂ හා තිරසාර නොවන තත්ත්ව මෙම කමිටුව විසින් සළකා බලන ලද බව දන්වා ඇත.එසේම යෝජිත විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබන ඉතා මිළ අධික හා සංවේදී උපාංගවල (ජෛවමිතික දත්ත ග්‍රහණය කරගැනීමට යොදාගනු උපාංග වැනි) ආරක්ෂාව මෙන්ම පරිශීලක නිලධාරීන්ගේ සහ සේවාලාභී පුරවැසියන්ගේ සුරක්ෂිතතාවය ද සැළකිල්ලට ගෙන ඇත. ඒ අනුව ගෘහස්ත භාවිතයට සුදුසු (Domestic type) ඒකක වෙනුවට කර්මාන්ත භාවිතයට සුදුසු (Industrial type) ඒකක වෙනුවෙන් ISO තත්ත්ව සහතික සහිත BS 1363, BS 6500, BS 5733 වැනි බ්‍රිතාන්‍ය ප්‍රමිතීන්, CE RoHS, REACH වැනි ප්‍රමිතීන් මෙන්ම වසර 03ක වගකීමක් ද සහිතව අවශ්‍ය මට්ටමේ පලපුරුද්දක් සහිත සමාගමක භාණ්ඩ හා සේවා සැපයුමට ප්‍රසම්පාදන යෝජනා කැඳවීමට තීරණය කර ඇත.

ඒ අනුව 2025 අප්‍රේල් 29 දින ලංසු කැඳවීම් අංක DRP/e-NIC/PRO/2025/06 යටතේ භාෂාත්‍රයෙන්ම පුවත්පත් දැන්වීම් පල කර යෝජනා කැඳවීම සිදු කරන ලදි. මෙය විවෘත හා පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියක් (National Competitive Bidding) වන අතර, එය කිසිදු සමාගමක් අරමුණු කරගෙන සිදු කිරීමක් නොවීය. ලංසු ලියවිලි ලබාගත් සමාගම් 11 න් 8ක් මුද්‍රා තැබූ ලංසු ඉදිරිපත් කරන ලද අතර, මිල විවෘත කිරීමේ දී විවිධ මිල ගණන් යටතේ වූ යෝජනා තිබූ අතර, එම මිළ ගණන් ඒ සඳහා සහභාගී වූ සියලු සමාගම් වලට දැනගත හැකිවන සේ ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරන ලදි.

ලංසු ඇගයීම් කමිටු විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියම 7.1 ට මුළුමණින්ම අනුගතව පියවර තුනක් යටතේ මෙම ලංසු 8 ඇගයීමට ලක් කරන ලදි:

1. අවම සුදුසුකම් සපුරාලීම පිළිබඳ මූලික පරික්ෂාව (Preliminary examination of bids)
2. විස්තරාත්මක තාක්ෂණික ඇගයීම (detailed evaluation)
3. පශ්චාත් සුදුසුකම් පරික්ෂාව (post qualification evaluation)

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.1 ට අනුව තෝරාගත යුත්තේ හුදෙක් අවම මිළ ඉදිරිපත් කළ ලංසුකරු නොව “සාරානුකූලව ප්‍රතිචාර දක්වන අවම ලංසුව” ය (Substantially Responsive Bid). ඒ අනුව, ඉදිරිපත් වූ යෝජනා අතරින් එසේ ප්‍රතිචාර දැක්වූ අවම ලංසුව තෝරා ගැනීමේ දී අවම මිල ඉදිරිපත් කළ සමාගම් මූලික පරීක්ෂාවෙන් හා තාක්ෂණික ඇගයීමෙන් අසමත් වීම මත ඉදිරි ඇගයීම් සඳහා තේරී පත් නොවූ අතර, අවසන් ඇගයීමට සුදුසුකම් ලත් ලංසු අතරින් අවශ්‍ය අවම තාක්ෂණික පිරිවිතර සහිත අවම මිල ගණන ලෙස ඒකක 700ක් වෙනුවෙන් රු. මිලියන 50 ක (වැට් රහිත) පමණ මිලක් ඉදිරිපත් කළ සමාගම තේරී පත්වී ඇත. එම සමාගමට වඩා වැඩි මිළ ගණන් ඉදිරිපත් කළ සමාගම් 03 ක් ද වූ අතර, යෝජිත සමාගමේ මිල ආරෝහණ පිළිවෙලට ගත් විට ලංසු 8ක් අතරින් 5 වන ස්ථානයේ පවතින ලදී. කිලෝ 3ක පමණ බරින් යුතු විය හැකි මෙවැනි ඒකක දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ප්‍රවාහනය කිරීමට යන වියදම්ද මේ සඳහා ඇතුළත් බව අවධාරණය කළ යුතුවේ.

එහෙත් මෙම ප්‍රසම්පාදනයේ අවසාන ප්‍රදාන තීරණයට පෙර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියම 8.5 ට අනුව ඉහත ක්‍රියාවලියේ දී සුදුසුකම් නොලත් පාර්ශව වෙතින් අභියාචන තිබේ නම් ඒවා සළකා බැලිය යුතු විය. එහි දී ඉතිරි සමාගම් අතරින් දෙකක් පමණක් එවන ලද අභියාචන සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බවට අදාල අභියාචනා කමිටුව විසින් නිර්දේශ කර අවසන් තීරණය සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙත එවා තිබුනි. තවමත් මෙම ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් අවසන් තීරණයක් ගෙන නොමැති අතර සියලු තත්වයන් සළකා බලා ඉදිරියේදී තීරණයක් ගැනීමට නියමිත ය.

මේ අනුව හුදෙක් මෙම ප්‍රසම්පාදනයේ අවසන් තත්ත්වය වනුයේ සුදුසුකම් ලැබූ ලංසු අතරින් සාරාණුකූලව ප්‍රතිචාර දැක්වූ අවම පිරිවැය ඉදිරිපත් කළ සමාගම හඳුනාගැනීමක් පමණක් වන අතර, එහි දී කිසිසේත්ම අවසානාත්මක ප්‍රදානයක් හෝ ගෙවීමක් දක්වා කටයුතු කර නැත. ලංසු ඉදිරිපත් කර මූලික අවශ්‍යතා අසම්පූර්ණ වීමෙන් අසමත් වූ පිරිස් හා සෙසු පාර්ශව විසින් ඍජුවම හා වක්‍රව විවිධ මාධ්‍ය මගින් දක්වා සිටි පරිදි අසාමාන්‍ය ලෙස අධි මිලැති විදුලි සම්බන්ධතා ඒකක ලබා ගැනීමට රජය පියවර ගෙන ඇති බවටත්, රජයට හිතවත්කම් ඇතැයි දක්වන ව්‍යාපාර වෙත මෙමගින් අයථා වාසි ලබා දීමට කටයුතු කර ඇති බවටත් දක්වන වාර්තා ප්‍රතික්ෂේප කරමු. විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ඉතිරි සියළු ප්‍රසම්පාදන ද ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මෙතෙක් සිදු කළ පරිදි ඉහළ පාරදෘශතාවයකින්, නිසි ප්‍රමිතියෙන් හා පිරිවැය සඵලදායකත්වයෙන් යුතුව සිදු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**
**2025 ජුලි 7**